# නේෂන්ස් විදේශ මුදල් ආයෝජන සැලැසුම් ගිණුමේ නියමයන් හා කොන්දේසි

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී හි — PQ118 ("බැංකුව") විවෘතකර ඇති සහ පවත්වාගෙන යනු ලබන සෑම නේෂන්ස් විදේශ මුදල් ආයෝජන සැලැසුම් ගිණුමක්ම ("FCY සැලසුම් ගිණුම්") පහත දැක්වෙන නියමයක් හා කොන්දේසි යටතේ පාලනයවේ.

## ගිණුම් විවෘත කිරීම

1. ගිණුම් විවෘත කරනු ලබන අවස්ථාවේදී (ගනුදෙනුකරු) බලපැවැත්වෙන FCY සැලසුම් ගිණුම් සඳහා අදාල වන යෝග්‍යතා නිර්ණායක සම්පූර්ණ කර ඇති වයස අවුරුදු දහඅටට (18) වැඩි ඕනෑම පුද්ගලයෙකුට, බැංකුව විසින් අනුගත කරගනු ලැබූ ප්‍රමිතිගත අනන්‍යතාව තහවුරුකර ගැනීමේ ක්‍රියාවලිය හරහා සහ බැංකුවේ ගිණුම් විවෘත කිරීම සඳහා වන ලේඛන සම්පූර්ණ කිරීම මගින් ගිණුමක් විවෘත කළ හැකිවේ.

2. සෑම FCY සැලසුම් ගිණුමක් සඳහාම, බැංකුව සමග ගනුදෙනු කරන සියලු ලියකියවිලි සහ සියලු තැන්පතුපත් වල සඳහන් කළයුතු ගිණුම් අංකයක් ලබාදිය යුතුය. ගනුදෙනුකරුට දැනුම්දීමක් සිදුකර එසේ ලබාදෙන අංකය වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතුය.

3. FCY සැලසුම් බද්ධ ගිණුම් විවෘත කිරීම සඳහා අවසර ලබා දෙනු නොලැබේ.

4. FCY සැලසුම් ගිණුමක් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලැබූ සෑම ගනුදෙනුකරුවකු විසින්ම මෙහි 10වන වගන්තියේ සඳහන් කාර්යය සඳහා ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් වලින් ඊට අදාල පුද්ගල විදේශ මුදල් ගිණුමක් (PFCA) හෝ ව්‍යාපාරික විදේශ මුදල් ගිණුමක් (BFCA) විවෘත කළ යුතුය. මාසික වාරිකය ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් වලින් පමණක් ගෙවිය යුතුය.

5. මෙම නියමයන්ට හා කොන්දේසි වලට අනුකූලව විවෘත කරන ලද සියලු විදේශ මුදල් ගිණුම් ("FCY ගිණුම්") එකී FCY ගිණුම් පාලනය කරන අදාල නීති යටතේ රීති හා නියෝග වලට යටත් විය යුතුය.

## කල්පිරීමේ ඉලක්ක ප්‍රමාණය සහ කල්පිරීමේ දිනය

6. 16 වන වගන්තියට යටත්ව අවම කල්පිරීමේ ඉලක්ක අගය ඇ.ඩො.10,000 (USD 10,000) ක් සහ උපරිම කල්පිරීමේ ඉලක්ක අගය ඇ.ඩො.50,000 (USD 50,000) ක් සහිතව FCY සැලසුම් ගිණුම් විවෘත කළ හැකිවේ.

7. බැංකුවේ නියමයන් හා කොන්දේසි වලට යටත්ව, FCY සැලසුම් ගිණුම ("ආයෝජන සැලැස්ම") යටතේ කල්පිරීමේ දිනයට ලැබීමට ගනුදෙනුකරු විසින් බැංකුව සමග ගිවිසගත් ප්‍රමාණය "කල්පිරීමේ ඉලක්ක අගය" යනුවෙන් අදහස්වේ.

   "කල්පිරීමේ දිනය" යනු බැංකුවේ නියමයන් හා කොන්දේසි වලට යටත්ව, ආයෝජන සැලැස්ම යටතේ ගනුදෙනුකරු විසින් කල්පිරීමේ ඉලක්ක අගය ලබාගනු ලබන දිනයවේ.

8. ගනුදෙනුකරුට වසර තුනක (3) අවම කාලසීමාවකදී සහ වසර පහක (5) උපරිම කාලසීමාවකදී හෝ බැංකුව විසින් කලින් කලට විශේෂයෙන් සඳහන් කරනු ලබන හෝ ඉඩදෙනු ලබන පරිදි එවන් වෙනත් කාලසීමාවක් තුළ කල්පිරීමේ ඉලක්ක අගය ළඟාකරගැනීම සඳහා තෝරාගත හැකිවේ.

9. FCY සැලසුම් ගිණුම විවෘතකරනු ලබන අවස්ථාවේදී ගනුදෙනුකරු විසින් FCY සැලසුම් ගිණුම විවෘත කිරීමේ ආකෘති පත්‍රයේ ඒ පිළිබඳ සඳහන් කරමින් ආයෝජන සැලැස්ම යටතේ ඔහු ලබාගැනීමට අපේක්ෂිත කල්පිරීමේ ඉලක්ක අගය තෝරාගත යුතුය. බැංකුවේ නියමයන්ට සහ කොන්දේසි වලට යටත්ව ගනුදෙනුකරු විසින් තොරාගනු ලැබූ කල්පිරීමේ දිනයේදී කල්පිරීමේ ඉලක්ක අගය ලබාගැනීමට සුදුසුකම් ලැබීම සඳහා FCY සැලසුම් ගිණුම විවෘත කිරීමේදී, බැංකුව ගනුදෙනුකරු විසින් එම ගිණුමේ මාසිකව තැන්පත් කළයුතු වාරිකය ගණනය කර එම ප්‍රමාණය සහ ගනුදෙනුකරු එකී මාසික වාරිකය ගෙවියයුතු දිනය පිළිබඳව දැනුම්දිය යුතුය.

## වාරික

9. කල්පිරීමේ ඉලක්ක අගය, ආයෝජන කාලසීමාව සහ ගිවිසුම්ගත පොළී අනුපාත (“මාසික වාරිකය”) පිළිබඳව සළකාබලා බැංකුව විසින් මාසික වාරිකය ගණනය කරනු ලැබේ.

10. මාසික පදනමින් FCY සැලසුම් ගිණුමට අරමුදල් සැලසීම පිණිස 35 සිට 44 වන වගන්තිය තෙක් වන විධිවිධානයන්ට යටත්ව PFCA හෝ BFCA සඳහා උපදෙස් ලබාදීම ගනුදෙනුකරු විසින් සිදුකරයි. ගනුදෙනුකරු විසින් තෝරාගනු ලැබූ කල්පිරීමේ ඉලක්ක අගය ලබාගැනීමට සුදුසුකම් ලැබීම සඳහා කල්පිරීමේ දිනය තෙක් සෑම මසකම මාසික වාරිකය සම්පූර්ණ මුදලම ගෙවිය යුතුය. බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි සම්පූර්ණ මාසික වාරිකය සෑම මසකම නියමිත දිනට පෙර ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක ගනුදෙනුකරුට කල්පිරීමේ දිනයට කල්පිරීමේ ඉලක්ක අගය ලැබීමට හිමිකමක් නැත.

11. මෙම නියමයන් හා කෝන්දේසි වලට අනුකූලව නියමිත වෙලාවට මාසික වාරිකය ගෙවීම තහවුරු කිරීම ගනුදෙනුකරුගේ වගකීමවේ. මාසික වාරිකය කල් ඉක්ම වන්නේ හෝ ප්‍රමාද වන්නේනම්, එවන් අවස්ථාවක ඒ පිළිබඳව ගනුදෙනුකරුට දැන්වීමට බැංකුව වගකිවයුතු නොවන අතර ඒ සඳහා බැඳී නොමැත.

## පොලිය සහ කල්පිරීමේදී ගෙවීම

12. FCY සැලසුම් ගිණුම විවෘත කරන අවස්ථාවේදී බැංකුව විසින් නියම කරන ලද පොලිය FCY සැලසුම් ගිණුමේ ඇති දෛනික ශේෂය මත ගණනය කළ යුතු අතර කල්පිරීමේ දිනය තෙක් මාසිකව FCY සැලසුම් ගිණුමට බැරකළ යුතුය. නීතිය මගින් පොළි අනුපාත වෙනස් කිරීමට අවශ්‍ය වන්නේනම් එසේ කිරීමේ අයිතිය බැංකුව සතුය.

13. FCY සැලසුම් ගිණුමේ කාලසිමාව තුළ FCY සැලසුම් ගිණුම යටතේ බැංකුව විසින් විශේෂයෙන් දක්වා ඇති මාසික වාරිකයේ ප්‍රමාණයට වඩා වැඩියෙන් හෝ එකී වාරිකයේ ගුණාකාරවලින් ගනුදෙනුකරු විසින් තැන්පත් කරන ලැබූ විට විශේෂයෙන් දක්වා ඇති මාසික වාරිකයට වැඩියෙන් ඇති ප්‍රමාණය සඳහා අඩු අනුපාතයකින් පොලිය ගණනය කිරීමේ හෝ එකී අමතර ප්‍රමාණය මත පොළී ගෙවීම රඳවා ගැනීමේ තනි හා පූර්ණ අයිතිය බැංකුව සතුවේ.

14. 16වන වගන්තියට යටත්ව හා නියමයන් හා කොන්දේසි වලට අනුකූලව බැංකුව විසින් ගනුදෙනුකරුට කල්පිරීමේ ඉලක්ක අගය ගෙවිය යුතුය.

15. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යකරන පරිදි, ගනුදෙනුකරුවන් විසින් ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍ර වල ඔවුන්ගේ බදු තත්වය සහ නේවාසික තත්වය සම්පූර්ණ කළ යුතුය.

16. FCY සැලසුම් ගිණුම මත ගෙවිය යුතු බදු (අදාල පොලිය අතුළුව) බදු (රඳවාගැනීමේ බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත බදු ඇතුලුව) (“බදු”) අඩුකිරීමට බැංකුවට හිමිකමක් ඇති අතර බැංකුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ එකී කාර්යය සඳහා නීතිය මගින් පිළිගත් එවන් වෙනත් අධිකාරියක් විසින් සඳහන්කර ඇති පරිදි එම අගයන් අඩුකළ යුතුය. අදාල ආයතනය විසින් ඉල්ලා සිටින්නේනම් ඉන් අනතුරුව ගනුදෙනුකරුට දැනුම්දීමකින් තොරව ඕනෑම වේලාවක ගනුදෙනුකරුගෙන් නොගෙවූ බදු අයකර ගැනීමේ අයිතිය බැංකුව සතුය.

17. පහත 21වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි හැර කල්පිරීමේ දිනයට පෙර ගනුදෙනුකරුට FCY සැලසුම් ගිණුමෙන් මුදල් ආපසු ලබාගැනීමට අවසර ලබාදෙනු නොලැබේ.

## කල්පිරීමේ දිනයට පෙර ගනුදෙනුකරු මියයාම

18. කල්පිරීමේ දිනයට පෙර ගනුදෙනුකරු මියගිය විටකදී, ආයෝජන සැලැස්ම අවසන් කළ යුතු අතර අදාල නීතියට අනුව ගනුදෙනුකරු මියගිය දිනට FCY සැලසුම් ගිණුමේ ඇති ශේෂය ඇතුලුව ආයෝජනය කරන ලද මුදල සහ ඊට අදාල සම්පූර්ණ සමුච්චිත පොලිය, ගනුදෙනුකරු විසින් ගෙවියයුතු බදු (අවසන් පියවීමේ වටිනාකම) බැංකුව විසින් ගෙවිය යුතුය.

19. ගනුදෙනුකරු විසින් FCY සැලසුම් ගිණුමක් විවෘතකකරනු ලබන අවස්ථාවේදී හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවකදී බැංකුවේ අදාල නීති සහ නියමයන් හා කොන්දේසි වලට අනුකූලව නම්කිරීමේ ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීම මගින් කල්පිරීමේ දිනයට පෙර ගනුදෙනුකරු මියගිය අවස්ථාවක අවසන් පියවීමේ වටිනාකම ගෙවියයුතු ප්‍රතිලාභියා හෝ ප්‍රතිලාභීන් නම්කළ යුතුය.

## ගිණුම අවසන් කිරීම

20. ගනුදෙනුකරු නියමිත දිනට යම් වාරික තුනක් (03) ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවකදී, යම් කාලසීමාවක් ලබාදී ඉන්පසුව බැංකුවේ නියමයන්ට හා කොන්දේසි වලට යටත්ව ආයෝජන සැලසුම අවසන් කිරීමේ,

FCY සැලසුම් ගිණුම වසා ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ FCY සැලසුම් ගිණුම වසාදැමීමේ ගාස්තු අඩුකර ගනුදෙනුකරුට ආයෝජන කරන ලද මූලික මුදල සමග එකී අවසන් කිරීමේ කාලය දක්වා සමුච්චිත පොලිය ගෙවීමේ අයිතිය

හෝ

FCY සැලසුම් ගිණුම වසා PFCA හෝ BFCA පාලනය කරනු ලබන නියමයන්ට හා කොන්දේසි වලට යටත්ව ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ FCY සැලසුම් ගිණුම වසාදැමීමේ ගාස්තු අඩුකර ගනුදෙනුකරුට ආයෝජනය කරන ලද මූලික මුදල සමග එකී අවසන් කිරීමේ කාලය දක්වා සමුච්චිත පොලිය ගනුදෙනුකරුගේ නමින් ඇති PFCA හෝ BFCA වෙත මාරු කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

21. විශේෂ අවස්ථාවකදී හා බැංකුවේ පූර්ණ අනුමැතිය ඇතිව හැර කල්පිරීමේ දිනයට පෙර FCY සැලසුම් ගිණුම වැසීමට හා/හෝ එහි ඇති ශේෂය ආපසු ගැනීමට ගනුදෙනුකරුවන්ට අවසර දෙනු නොලැබේ. බැංකුව විසින් කල්පිරීමේ දිනයට පෙර FCY සැලසුම් ගිණුම වැසීමට ගනුදෙනුකරුට අවසර ලබාදෙන අවස්ථාවකදී, බැංකුවේ නියමයන්ට හා කොන්දේසි වලට යටත් විය යුතුය, බැංකුවේ තනි අභිමතය පරිදි ගනුදෙනුකරු විසින් ගෙවියයුතු බදු සහ සියලු අදාල දණ්ඩන පොලියක් වේනම් එයද ඇතුලුව FCY සැලසුම් ගිණුම වසාදැමීමේ ගාස්තු අඩුකර අවසන් කරනු ලබන කාලය දක්වා සමුච්චිත පොලිය එකතුව ගනුදෙනුකරුට ගෙවිය යුතු ආයෝජනය කරන ලද මූලික මුදල ගෙවිය යුතුය.

22. ආයෝජන සැලැස්ම අවසන්කරනු ලැබූ හා/හෝ FCY සැලසුම් ගිණුම වසාදමනු ලැබූ අවස්ථාවක, 20 හා 21 වන වගන්තිය යටතේ ගණන් ගෙන ඇති කුමන හෝ තත්වයක් යටතේ, එකී වසාදැමීම සිදුකරන අවස්ථාවේදී බැංකුවේ පූර්ණ අභිමතය පරිදි තීරණය කරනු ලබන පරිදි ගිවිසුම්ගත පොලී අනුපාතයට වඩා අඩු අනුපාතයකින් FCY සැලසුම් ගිණුමේ ආයෝජනය කර ඇති මූලික මුදල මත පොලී ගෙවීමට බැංකුවට හිමිකම් තිබිය යුතුය. එකී අවස්ථාවක අදාල දණ්ඩන පොලියක් වේනම් එය අදාලවේ.

23. ගනුදෙනුකරු විසින් අවසන්වරට ලබාදෙනු ලැබූ ලේඛනයන්හි දැක්වෙන ගනුදෙනුකරුගේ ලිපිනයට කිසිම හේතුවක් නොදක්වා මාස දෙකක (02) ලිඛිත දැනුම් දීමකින් අනතුරුව සිය පූර්ණ අභිමතය පරිදි ආයෝජන සැලසුම් ගිණුම අවසන් කිරීමේ සහ FCY සැලසුම් ගිණුම වසාදැමීමේ අයිතිය බැංකුව සතුය.

කල්පිරීමේ දිනයට පෙර බැංකුව ආයෝජන සැලැස්ම අවසන් කරනු ලබන අවස්ථාවේදී, බැංකුවේ නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු අඩුකර එකී ගිණුම අවසන් කරනු ලබන දිනය දක්වා සමුච්චිත පොලිය සමග ආයෝජනය කරන ලද සම්පූර්ණ මූලික මුදල ගනුදෙනුකරුට ගෙවිය හැකිවේ.

24. FCY සැලසුම් ගිණුම විවෘත කරනු ලබන අවස්ථාවේදී ගනුදෙනුකරු විසින් තෝරාගනු ලැබූ ආයෝජන සැලසුමේ විස්තර සඳහන් ආයෝජන පිළිබඳ දැන්වීමක් FCY සැලසුම් ගිණුම විවෘත කරනු ලබන අවස්ථාවේදී ගනුදෙනුකරු විසින් තෝරාගත් ආකාරයෙන් ගනුදෙනුකරුට සන්නිවේදනය කළ යුතුවේ. ගනුදෙනුකරුට පාස්පොතක් ලබාදෙනු නොලැබේ.

25. බැංකුව විසින් ගනුදෙනුකරුට FCY සැලසුම් ගිණුම් පිළිබඳ ද්විවාර්ෂික ප්‍රකාශ ලබාදිය යුතුය. කෙසේවුවද, බැංකුවට සිය අභිමතය පරිදි ප්‍රකාශ ලබාදීමේ වාර ගණන වෙනස්කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

26. බැංකු ප්‍රකාශය ලැබිය යුතු නියමිත දින (උදා ජූනි තිහ (30) සහ දෙසැම්බර් තිස් එක (31) දින) සිට දින පහළොවක් (15) ඇතුළත FCY සැලසුම් ගිණුම් ප්‍රකාශන නොලැබුනේ නම් බැංකුවට උපදෙස් ලබාදිය යුතුය. බැංකුවෙන් ලැබුණු සෑම FCY සැලසුම් ගිණුම් ප්‍රකාශනයක්ම නිරවද්‍යතාවය සහතික කිරීම පිණිස පරීක්ෂා කිරීමට ගනුදෙනුකරු එකඟවේ. යම් වරදක් වේනම් ප්‍රකාශන ලැබී දින විසි එකක් (21) ඇතුලත බැංකුවට දැනුම් දිය යුතුය.

27. ඔහුගේ/ඇයගේ ප්‍රකාශවල පිටපත් ආරක්ෂිතව තබාගැනීම ගනුදෙනුකරුගේ වගකීමවේ. බැංකුවෙන් ප්‍රකාශයන්හි පිටපත් ඉල්ලා සිටිය හැකි අතර ප්‍රකාශයට පත්කර ඇති තීරුබදුවලට අනුකූලව මෙම සේවාව සැපයීම වෙනුවෙන් ගාස්තු අයකිරීමේ අයිතිය බැංකුව සතුය.

28. ගනුදෙනුකරුගේ ලේඛනයන්හි යම් වෙනසක් වේනම් ඒ පිළිබඳව ඉක්මනින් බැංකුවට දැනුම්දිය යුතුය.

29. සිය රාජකාරි හා/හෝ බැඳීම් ඉටුකිරීම සඳහා එකී අනාවරණයන් අවශ්‍යයයි සලකනු ලබන පරිදි හා එවන් අවස්ථාවක හා/හෝ බැංකුවේ නෛතික ව්‍යාපාරික අරමුණු සඳහා එකී අනාවරණයන් අවශ්‍ය වන අවස්ථාවකදී බැංකුව සමග ගනුදෙනුකරුගේ FCY ගිණුම් හා අදාල තොරතුරු ඇතුලුව ගනුදෙනුකරුට අදාල කිසියම් තොරතුරක් අනාවරණය කිරීම සඳහා ගනුදෙනුකරු විසින් මෙමගින් බැංකුවට බලය ලබාදේ.

30. මෙම නියමයන් හා කොන්දේසි යටතේ විශේෂයෙන් සඳහන්කර ඇති ආකාරයෙන් හැර FCY සැලසුම් ගිණුම යටතේ ගනුදෙනුකරුට යම් අයිතියක් පැවරීම, මාරුකිරීම හෝ උකස් කිරීම සිදුකල නොහැකි අතර එකී ගනුදෙනු මගින් ඍජු හෝ වක්‍රාකාරයෙන් කිසියම් පාඩුවක් ඇතිවීම සඳහා බැංකුව බැඳී නොසිටින අතර ඒ සඳහා වගකියනු නොලැබේ.

31. මෙහි සඳහන් කිසියම් දෙයකට පටහැනිව වුවද, බැංකුව ගනුදෙනුකරුට දැනුම්දීමකින් තොරව ගනුදෙනුකරුගේ FCY සැලසුම් ගිණුම ගනුදෙනුකරුගේ වෙනත් ගිණුමක් හෝ බැංකුව සමග ගනුදෙනුකරුට ඇති යම් බැඳීමක් සමග සම්බන්ධ කිරීම හෝ ඒකාබද්ධ කිරීම සහ ගනුදෙනුකරු වෙතින් බැංකුවට ගෙවීමට ඇති වෙනත් යම් ගිණුමක් සම්බන්ධයෙන් FCY සැලසුම් ගිණුමේ බැරට ඇති යම් මුදලක් හිලව් කිරීමට හෝ මාරුකිරීමට හෝ එකී බැඳීම් තත්‍ය හෝ අනියම්, ප්‍රාථමික හෝ ඒකපාර්ශ්වික සහ කීපයක් හෝ බද්ධවුවද  වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් බැංකුවට හැකියාව ඇත.

32. සිය තනි හා පූර්ණ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක මෙම නියමයන් හා කොන්දේසි වෙනස් කිරීම, සංශෝදනය කිරීම හෝ එකතු කිරීමේ අයිතිය බැංකුව සතුවන අතර එකී වෙනස් කිරීම්, සංශෝදනය කිරීම් හෝ එකතුකිරීම් තැපැල් මාර්ගයෙන් ගනුදෙනුකරුට යැවිය යුතු හා/හෝ මුද්‍රණාලයට ලබාදීම හා/හෝ බැංකු ශාඛාවන්හි දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීම හා/හෝ ප්‍රකාශ පණිවිඩ හරහා යැවිය යුතුය. මේ යටතේ ඇති යම් දැන්වීමක් ගනුදෙනුකරුගේ අවසන්වරට වාර්තාවූ ලිපිනයට තැපැල්කර දින හතක් (07) ඇතුලත ගනුදෙනුකරුට ලැබී ඇති බවට සලකනු ලැබිය යුතුය. එසේ ගනුදෙනුකරුට සිදුකරන දැනුම්දීමක් ප්‍රමාණවක් හා නිසිපරිද සිදුකරන දැන්විමක් වශයෙන් සැලකිය යුතු අතර ගනුදෙනුකරු ඒ සඳහා බැඳී සිටිය යුතුය.

මෙම නියමයන් හා කොන්දේසි සඳහා නීතිය මගින් එකී සංශෝදනය අවශ්‍යවන්නේ නම්, මෙම නියමයන් හා කොන්දේසි ඉබේම සංශෝදනයවේ.

33. මෙහි ඇතුලත් නියමයන් හා කොන්දේසි වලට අමතරව, ගිණුමක් විවෘත කිරීමට පෙර සියලු ගනුදෙනුකරුවන් වෙත නිකුත් කරනු ලබන බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි වලට ව්‍යවස්ථාගත නියමයන්ට හා කොන්දේසි වලට FCY සැලසුම් ගිණුම යටත්විය යුතු හා බැඳී සිටිය යුතුය. ගනුදෙනුකරු එකී නියමයක් හා කොන්දේසි සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි වලට ඇතුලත්කර හෝ නොමැතිද යන වග නොසලකා මෙහි ඇතුලත් සියලු නියමයන් හා කොන්දේසිවලට බැඳී සිටිය යුතුය.

34. මෙම නියමයන් හා කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිය යටතේ පාලනය විය යුතුය.

35. ගෙවීම් බලපැවැත්වෙන දිනට, ඉදිරිපත්කර ඇති චෙක්පත් හෝ බැංකුව සමග පවතින වෙනත් යම් ක්‍රමවේදයක් මගින් ගෙවීම නියෝග කිරීමේ ප්‍රමුඛතාව තීරණය කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

36. PFCA හෝ BFCA හි මුදල් නොමැතිවීම හේතුවෙන් නියමිත දිනට ගෙවීම් නොකරන ලද යම් ගෙවීමක් නියමිත දිනට පසු බලාත්මකවීමට බැංකුව බාරගනු නොලබන අතර PFCA හෝ BFCA හි ප්‍රමාණවත්ව මුදල් තැන්පත්කර ඇති නම් බැංකුව විසින් මෙම ස්ථාවර උපදෙස්වලට යොමුව විශේෂයෙන් දැනුම්දිය යුතුය.

37. අනුයාත මාස දෙකක (02) කාලයක් සඳහා PFCA හෝ BFCA හි ප්‍රමාණවත් මුදල් නොමැතිනම්, ගනුදෙනුකරුට කිසිම උපදෙසක් නොදී බැංකුවට සිය ස්ථාවර උපදෙස් අවලංගු කළහැකිවේ.

38. මරණය හෝ බුන්වත්බව/ ඇවර කිරීම නොතකා බැංකුව විසින් එකී මරණය හෝ බුන්වත්බව, ඇවර කිරීම හෝ අහෝසි කිරීම පිළිබඳ දැන්වීම ලැබෙන තෙක් ස්ථාවර උපදෙස් බලාත්මකව පැවතිය යුතුය.

39. ස්ථාවර උපදෙස් සම්බන්ධ කිසියම් සංශෝදනයන් සහ අවලංගුකිරීම් ඊළඟ අනුයාත ගෙවීමට අවම වශයෙන් එක් (01) සතියකට පෙර බැංකුව වෙත ලැබීමට සැලැස්විය යුතුය. එක් එක් සංශෝදනය සඳහා ගාස්තු අයකළ යුතුය.

40. බැංකුවට බලපාන සෑම ආවර්තිත ගෙවීමක් සඳහාම කොමිස් ගාස්තුවක් අයකළ හැකිය. අදාල ආනුශංගික තැපැල් ගාස්තු හා/හෝ මුද්දර ගාස්තු මෙම ගාස්තුවලට ඇතුලත් නොවේ.

41. බැංකුවට සිය අභිමතය පරිදි සෑම ස්ථාවර උපදෙසක් මතම ගාස්තුවක් අයකළ හැකිවේ.

42. මෙම ප්‍රේෂණයන් සිදුකිරීමේදී වැරදි, මග හැරීම්, හෝ ප්‍රමාදයන් මගින් සිදුවියහැකි කිසියම් ආනුශංගික පාඩුවක් හෝ හානියක් ඇතුලු පාඩු හා හානි සඳහා වන සියලු හිමිකම් ඉල්ලීම වලින් බැංකුව නිදහස් බව විශේෂයෙන්ම අවබෝධවේ.

43. FCY සැලසුම් ගිණුම් ප්‍රකාශයන්හි තොරතුරු සඳහන්ව ඇති බැවින් ස්ථාවර උපදෙස් වලට අනුකූලවූ වෙනත් උපදෙසක් ගනුදෙනුකරුට යැවිය යුතු නැත.

44. ගෙවීම බලාත්මකවන දිනය ඉරිදා හෝ බැංකු නිවාඩු දිනයක් වේනම්, ඊළඟ වැඩකරන දිනයේදී ගෙවීම් සිදුකළ යුතුය.

මවිසින් අයදුම්කර ඇති FCY සැලසුම් ගිණුම්ට අදාලව බැංකුව විසින් නිකුත්කර ඇති නියමයන් හා කොන්දේසි සමගින් එකී FCY සැලසුම් ගිණුම හා අදාල තොරතුරු මෙහි අත්සන් කැබීමට පෙර මාහට ලබාදී තේරුම්කර දෙනු බවත් මා එය කියවා එහි ඇතුලත් නියමයන් හා කොන්දේසි වල විස්තර තේරුම්ගත් බව මෙමගින් කහවුරු කරන අතර ඒ සඳහා බැඳිමට එකඟවන අතර කැමැත්ත ප්‍රකාශ කරමි.

අත්සන

නම:

දිනය: